අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ - 02/2023

මගේ අංකය : MOJ/E9/පි.ගා.ස./2021
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10.
2023.07. 10

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර් අභියාචනාධිකරණය,

<u>අධිකරණ හා කම්කරු විනිශ්චය සභා මඟින් නිකුත් කරනු ලබන පිටපත් ගාස්තු සහ සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ගාස්තු</u>

2022.12.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020(II), 2022 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) පනතෙහි 442 වගන්තිය, සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි 205 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හා අංක 2,340 දරන 2023.07.07 දිනැති රජයේ ගැසට් නිවේදනය ප්‍රකාරව, අධිකරණයක නඩු තීන්දුවකින් හෝ අවසාන ආඥාවකින් බලපෑමට ලක්ව ඇති යම් තැනැත්තෙකු විසින්, එම තීන්දුවේ හෝ අවසාන ආඥාවේ හෝ යම් දිවුරුම් සාක්ෂියක හෝ එම නඩු වාර්තාවේ වෙනත් කොටසක පිටපතක් ඉල්ලුම් කරනු ලැබූ විට, යම් විශේෂ හේතුවක් නිසා එය ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දීම සුදුසු යයි අධිකරණය විසින් සලකනු නොලබන අවස්ථාවන්හිදී, එම පිටපත් නිකුත් කිරීම වෙනුවෙන් දැනට අයකරනු ලබන ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. <u>සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ගාස්තු</u>

1.1 ඡායා පිටපත් නිකුත් කිරීමේ යන්ත්‍ර(Photo copy machine) මඟින් ලබා ගෙන නිකුත් කරනු ලබන සහතික කරන ලද ඡායා පිටපත් කොළයක් සඳහා රු. 12.00 ක ගාස්තුවක් හා කොළයක එක් පැත්තක් සඳහා රු. 8.00 ක ගාස්තුවක් අයකළ යුතුය. මෙලෙස අයකරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | පිටපත් ලබා ගන්නා නිලධාරියාට | 10% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 5% |
| III. | රජයේ ගාස්තුව | 85% |

1.2 ඉදිරිපත් කරනු ලබන පිටපත් සහතික කිරීමේදී එක් කොළයක් සඳහා රු. 7.00 ක ගාස්තුවක් හා කොළයක එක් පැත්තක් සඳහා රු. 4.00 ක ගාස්තුවක් අයකළ යුතුය. මෙලෙස අය කරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | සැසඳුම් කරන නිලධාරියාට | 20.84% |
| II. | සහතික කරන නිලධාරියාට | 20.84% |
| III. | රජයේ ගාස්තුව | 58.32% |

1.3 පරිගණකයක ගබඩා කර තිබූ යතුරු ලියනය කරන ලද ලේඛණයක එක් කොලයක මුද්‍රිත පිටපතක් සඳහා රු. 17.00 ක ගාස්තුවක් හා කොළයක එක් පැත්තක් සඳහා රු. 12.00 ක ගාස්තුවක් අයකළ යුතුය. මෙලෙස අය කරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | පිටපත් ලබා ගන්නා නිලධාරියාට | 7 % |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 3.5 % |
| III. | රජයේ ගාස්තුව | 89.5 % |

02. <u>පිටපත් යතුරුලියනය කිරීමේ හා සහතික කිරීමේ ගාස්තු</u>

යතුරුලියනය කිරීමේ යන්ත්‍ර මඟින් නිකුත් කරනු ලබන සහතික පිටපත් සඳහා පහත පරිදි ගාස්තු අයකළ යුතුය.

2.1 යතුරු ලියන පේළි 25 ට වැඩි පිටුවක් සඳහා රු. 30.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 30% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 18% |
| III. | රජයේ ගාස්තුව | 52% |

2.2 යතුරු ලියන පේළි 15 සිට 25 දක්වා රු. 25.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 24% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 14.4% |
| III. | රජයේ ගාස්තුව | 61.6% |

2.3 යතුරු ලියන පේළි 15 ට අඩු පිටුවක් සඳහා රු. 22.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 18.19% |
| II. | හරි වැරදි බලා සහතික කරන නිලධාරියාට | 10.91% |
| III. | රජයේ ගාස්තුව | 70.9% |

03. <u>කාබන් පිටපත් නිකුත් කිරීමේ ගාස්තු</u>

කාබන් පිටපත් මඟින් සහතික පිටපත් නිකුත් කිරීමේදී පහත පරිදි ගාස්තු අයකළ යුතුය.

3.1 පේළි 25 ට වැඩි පිටුවක් සඳහා රු. 13.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 26.96% |
| II. | රජයේ ගාස්තුව | 73.04% |

3.2 පේළි 15 සිට 25 දක්වා රු. 12.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | යතුරු ලියන නිලධාරියාට | 20.84% |
| II. | රජයේ ගාස්තුව | 79.16% |

3.3 පේළි 15 ට අඩු පිටුවක් සඳහා රු. 11.00 ක ගාස්තුවක් අයකළ යුතු අතර එම ගාස්තු පහත සඳහන් පරිදි බෙදා හැර ගෙවීම් කළ යුතුය

| | | |
|---|---|---|
| I. | යතුරුලියන නිලධාරියාට | 13.64% |
| II. | රජයේ ගාස්තුව | 86.36% |

04. පරිගණක යන්ත්‍ර හෝ යතුරු ලියන යන්ත්‍ර භාවිතයෙන් යතුරු ලියනය කර සහතික පිටපත් නිකුත් කිරීමේදී පළමු පිටපත සඳහා ඉහත අංක 02 ඡේදය පරිදි ගාස්තු අයකළ යුතු අතර, එහිදී අදාළ පිටපත ලබා දීම වෙනුවෙන්ම එම ලේඛනය යතුරු ලියනය කර ඇති බව අදාළ වවුචර්පත් නිර්දේශ කරන නිලධාරියා විසින් පෞද්ගලිකව සෑහීමට පත්විය යුතුය.

05. පිටපත් ගාස්තු වැඩිකිරීම හේතුවෙන් මහජනතාවට වන අපහසුතා වළක්වා ගැනීම සඳහා පිටපත් ගාස්තු අය කිරීමේදී ඉහත සඳහන් නිවැරදි බාණ්ඩය යටතේ පිටපත් ගාස්තු අයකරන බවට පිටපත් ගාස්තු අයකරගන්නා නිලධාරියා පෞද්ගලිකව සෑහීමකට පත්විය යුතුය.

06. වෙළඳපොළ තුළ ලිපි ද්‍රව්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු ඉහත පරිදි සංශෝධනය කිරීම සිදු කර ඇති අතර, ඒ හේතුවෙන් මහජනතාවට දැරීමට සිදුවන පිරිවැය විශාල වශයෙන් ඉහළ යාම වළක්වා ගැනීම අරමුණු කර ගනිමින් සහතික පිටපත් නිකුත් කිරීම සඳහා සහභාගී වන නිලධාරීන්හට දැනට ගෙවනු ලබන දීමනා ඉහළ දැමීම කෙරෙහි මේ අවස්ථාවේදී පියවර ගෙන නොමැත.

07. සහතික පිටපත් නිකුත් කිරීම මඟින් රජයට ලැබිය යුතු අදායම නිසි පරිදි ලැබේද යන්න සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන්හිදී නිරන්තරයෙන් පරික්ෂා කිරීම් සිදු කළ යුතුය.

08. රාජකාරී වේලාවෙන් පසුව සහතික පිටපත් නිකුත් කිරීමට අදාළ රාජකාරී කටයුතුවල නිරතවන නිලධාරීන්හට, ඒ වෙනුවෙන් අතිකාල හෝ වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත ඉහත සඳහන් දීමනා ගෙවීම සිදු කළ යුතුය.

09. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/RED/REG/F&C/2023/Justice හා 2023.05.22 දිනැති ලිපිය අනුව ඉහත ගාස්තු අයකිරීම මඟින් ලැබෙන සියළුම ආදායම්, ආදායම් ශීර්ෂ 2003-99-00 යටතේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර සියලුම වියදම් අයවැය ප්‍රතිපාදන මඟින් සලසාගත යුතු බැවින් ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ අමුද්‍රව්‍ය සඳහා වන වියදම වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් වෙන් කර ගැනීමට කටයුතු කළ යුතුය.

10. සහතික කරන ලද පිටපත් ඉල්ලුම් කරනු ලබන දිනයේ සිට සතියක් ඇතුළත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම ගාස්තු අයකිරීම් හා ගෙවීම් පිළිබඳව විධිමත් වාර්තාවක් අදාළ අධිකරණයේ ගණකාධිකාරීවරයා/රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යා යුතු අතර අයකරනු ලබන ගාස්තු සඳහා රිසිට්පත් නිකුත් කළ යුතුය.

11. 1997.10.07 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 13/97, 1998.01.06 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 1/98 හා 2006.06.01 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 06/2006 මෙයින් අවලංගු කරනු ලැබේ.

12. මෙම චක්‍රලේඛ විධිවිධාන 2023.07.07 දින සිට ක්‍රියාත්මක වේ.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත් : 1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය